බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) උප වගන්තිය ප්‍රකාර සභාව වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක කළමනාකරණ විගණකාධිපති වාර්තාව

| විගණන ඡේදය | විගණන විමසුම | පැහැදිලි කිරීම | ඇමුණුම |
|---|---|---|---|
| **1. මූල්‍ය ප්‍රකාශන**<br><br>**1.4.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.** | (අ) පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියෙන් බැහැරවීම.<br>(i) ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.27 සිට 3.32 අතර ඡේදනයන්ට අනුකූලව නොවන ලෙස මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ අතිරික්තයට ගැලපුම් කිරීමේදී ආදායමට හදුනාගත් පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු.326,142 අඩු කිරීම වෙනුවට රු.9,814.127ක් අඩු කිරීමද, රු.35,342,9354ක් වූ ජංගම වත්කම්වල අඩුවීම එකතු කිම වෙනුවට රු.33,487,4078ක් ලෙස දෙවරක් අඩු කිරීමද කර තිබූ අතර උපකරණ ඉවත් කිරීමෙන් වූ පාඩුව රු.64,657ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි. | | |
| **1.4.3. ගිණුම් අඩුපාඩු** | (i) පෙර වර්ෂවල ලද ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළ වාර්ෂික ක්ෂය ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේ ආදායමට හඳුනාගෙන නොතිබුණි. | | |
| | (ii) සමාලෝචිත වර්ෂය සඳහා ලද රු.9,814,127 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ ලද ප්‍රාග්ධන ප්‍රදාන ලෙස දැක්වීම වෙනුවට අතිරික්තයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස දක්වා තිබුණි. | | |
| **1.5. අනුකූල නොවීම.**<br>**1.5.1. නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට අනුකූල නොවීම.** | 1. 134 (1) වගන්තිය<br>දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශිය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ යම් නිශ්චල දේපලක වාර්ෂික වටිනාකම මත වරිපනම් බද්දක අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව අය කළ යුතු වුවත් වරිපනම් බදු සඳහා 2010 වර්ෂයේ තක්සේරුව මත බදු අය කර ගැනිම. | . | |

| විගණන ඡේදය | විගණන විමසුම | පැහැදිලි කිරීම | ඇමුණුම |
| --- | --- | --- | --- |
| | ii)154 වගන්තිය<br>සභා බල ප්‍රදේශය තුල වෙන්දේසි කර විකුණනු ලබන ඉඩම්වල විකුණුම් වටිනාකමින් සියයට 01ක බද්දක් සභාව විසින් අයකළ යුතු වුවත්, එයට පටහැනිව ඉඩම්වල තක්සේරු වටිනාකම පදනම් කර ගෙන බදු අය කර තිබුණි. | | |
| | iii) 158 වගන්තිය<br>හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපල තහනම් කිරීම් මේ දක්වා කර නොතිබුණි. | | |
| | (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>(i) මුදල් රෙගුලාසිය 1645<br>සභාව සතු වාහන සඳහා ධාවන සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් තිබුණි. | | |
| | ඇ) 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරණ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශය<br>• රජයේ පිළිගත් වෘත්තිය තක්සේරුකරුවෙක් ලවා ගොඩනැගිලි තක්සේරු කර නොතිබුණි. | | |

| විගණන ඡේදය | විගණන විමසුම | පැහැදිලි කිරීම | ඇමුණුම |
|---|---|---|---|
| **2. මූල්‍ය සමාලෝචනය**<br>**2.1 මූල්‍ය ප්‍රතිඵල**<br>**2.2 ආදායම් පරිපාලනය**<br>**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**<br>**2.2.2 ආදායම් රැස් කිරිමේ කාර්යසාධනය** | අ) 2022 ජනවාරි 01 දිනට වරිපනම් බදු හිඟය රු.3,737,705ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.1,973,226 ක් හෙවත් සියයට 53ක් අයකර නොතිබුණි. | | |
| | ආ) සභා බල ප්‍රදේශය තුල හඳුනාගත් වරිපනම් ඒකක සංඛ්‍යාව 6,916 ක් වුවත්, ඉන් ඒකක 4,748 කින් පමණක් වරිපනම් අයකර තිබු අතර ඒකක 2,168 කින් වරිපනම් අය කිරිම සඳහා කටයුතු කර නොතිබුණි. | | |
| | (ඇ)2022 ජනවාරි 01 දිනට වෙළඳ ස්ථාන කුලී හිඟය රු.2,916,712ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.1,474,423 ක් හෙවත් සියයට 16 ක් අයකර නොතිබුණි. | | |
| | (ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ වෙළඳ ස්ථාන කුලී බිල් කිරිම රු.4,872,735 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.981,945 හෙවත් සියයට 20ක් අය කර ගෙන නොතිබුණි. | | |

| විගණන ඡේදය | විගණන විමසුම | පැහැදිලි කිරීම | ඇමුණුම |
|---|---|---|---|
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,368,499ක් හා මුද්දර ගාස්තු රු.6,856,431 ක් විය. | | **07,08** |
| **3. මෙහෙයුම් සමාලෝචනය**<br>**3.1.කළමනාකරණ අකාර්යක්ෂමතා** | (අ) සමාලෝචිත වර්ෂය තුල මාර්ග 04ක් ඉදි කිරිම සඳහා හදිසි මිලදි ගැනීම් ලෙස වටිනාකම රු.195,000ක ABC කියුබ් 10ක් මිලදි ගෙන තිබුණද, ගැලනිගම එකමුතු මාවත සංවර්ධනය නොකර ඉතිරි මාර්ග 03 සඳහා පමණක් ABC දමා තිබුණි බව නිරික්ෂණය විය.කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා තල්පිටි වැඩ අංගනයට 2022 දෙසැම්බර් 16දින ABC කියුබ් 01 පමණක් ලැබී තිබුණු අතර හදිසි මිලදි ගැනීම් යටතේ මිලදි ගත් කියුබ් ප්‍රමාණය පිළිබඳ ලේඛන මඟින් තහවුරු නොවුනි. | | **09,10,11** |

| විගණන ඡේදය | විගණන විමසුම | පැහැදිලි කිරීම | ඇමුණුම |
|---|---|---|---|
| | (ආ)අමුද්‍රව්‍ය මිලදී ගැනීමට පෙර නඩත්තු කළ යුතු මාර්ග පිළිබඳ සැලැස්මක් සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතු වුවත්, එසේ නොමැතිව සමාලෝචිත වර්ෂය තුල රු.2,851,200ක් වූ කෝලාස් බැරල් 80ක් සහ රු.780,000ක් වූ චිප්ගල් කියුබ් 40ක් මිලදී ගෙන තිබුණි. | | |
| | (ඇ)ප්‍රිමික්ස් සඳහා අමුද්‍රව්‍ය සැපයීමට තෝරා ගත් සැපයුම්කරු වෙත මාස 03ක ප්‍රමාදයකින් පසු ඇණවුම යැවීම නිසා එක් චිප්ගල් කියුබ් 01ක් සඳහා එකඟ වූ මිලට වඩා රු.3,600ක් වැඩිපුර ගෙවා චිප්ගල් කියුබ් 40ක් මිලට ගෙන තිබුණි. | | |
| | (ඈ) තාක්ෂණ නිලධාරින් විසින් වැඩ අංගනය වෙත ලද අමුද්‍රව්‍ය ප්‍රමාණ මිණුම් කර ලිඛිත වාර්තාවක් ලබාදිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුල මිලදී ගන්නා ලද වැලි, චිප්ගල් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | | |

| විගණන ඡේදය | විගණන විමසුම | පැහැදිලි කිරීම | ඇමුණුම |
|---|---|---|---|
| | (ඊ) බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවෙන් වෙනම ඒකකයක් ලෙස 2018 පෙබරවාරි 11 දින මිල්ලනිය ප්‍රාදේශීය සභාව ස්ථාපිත කර තිබුණු අතර වසර 05කට ආසන්න කාලයක් ගත වි තිබුණද බණ්ඩාරගම ප්‍රාදේශිය සභාව විසින් මිල්ලනිය ප්‍රාදේශිය සභාව වෙත ගෙවිමට එකඟ වී තිබු රු.8,000,000ක මුදල 2022 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවා නොතිබිම හේතුවෙන් වත්කම් බෙදීමේ කාර්යය තවදුරටත් ප්‍රමාද වි තිබුණු බව නිරික්ෂණය විය. | | |
| **3.2. වත්කම් කළමනාකරණය** | (අ) 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කොටස් කර වෙන්දේසි කරන ලද ඉඩම් වල වෙන් කරන ලද මාර්ග ප්‍රමාණය ගණනය කර මාර්ග ලේඛනයට ඇතුලත් කර නොතිබුණු අතර 2018 වර්ෂයෙන් පසු මාර්ග ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | | |
| | (ආ)1946 අංක 57 දරණ පොදු සුසාන හා පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 10 වගන්තිය ප්‍රකාරව සුසානභූමිවල ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැට මායිම් සකස් කළ යුතු වුවත්, සභාව සතු කිසිදු සුසාන භූමියක වැට මායිම් සකස් කර නොතිබුණි. | | |
| | (ඇ)බණ්ඩාරගම ප්‍රාදේශිය සභා පරිපාලනය යටතේ ඇති සුසාන භූමි 25ක හිමිකම සභාව වෙත පවරා ගෙන නොතිබුණි | සභාව වෙත පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.ඒ අනුව පැවරුම් නියෝග ලබාගැනීමට අදාල ඉල්ලුම් පත්‍ර සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය ලබාගැනිම සඳහා 2023.6.28 දිනැති ලිපිය මගින් යොමු කළ අතර ඒ අනුව පළාත් පාලන කොමසාරිස් (බ.ප) LGD/10E/LAND-AGK/2022 හා 2023.08.04 දිනැති ලිපිය මගින් අදාල ඉල්ලුම්පත්‍ර ප්‍රාදේශීය ලේකම් වෙත යොමුකර ඇත. | |
| | ඇ) 2020 දෙසැම්බර් 09 දිනැති අංක 08/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ධාවන තත්ත්වයේ නොපවතින අළුත්වැඩියා කිරිම ඵලදායි වන මෝටර් බයිසිකල් අළුත්වැඩියා කර නොතිබුණි. | | |

| විගණන ඡේදය | විගණන විමසුම | පැහැදිලි කිරීම | ඇමුණුම |
|---|---|---|---|
| **3.3. ප්‍රසාම්පාදන කළමනාකරණය** | මිල ගණන් කැඳවීමට පෙර ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් මිලදී ගැනීම් සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ඒ සඳහා අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කරවා ගෙන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කිරීමකින් තොරව වායු සමීකරණ 04ක් රු.977,497 කට මිලදී ගෙන තිබුණි. | | |
| **3.4.මානව සම්පත් කළමනාකරණය** | මියගිය, සේවය හැරගිය, විශ්‍රාම ගිය හා වැඩ තහනම් කළ සේවකයින් 11 දෙනෙකුගෙන් අය විය යුතුව තිබු රු.845,590 කණය ශේෂය 2023 මැයි 30 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. | | |

| විගණන ඡේදය | විගණන විමසුම | පැහැදිලි කිරීම | ඇමුණුම |
|---|---|---|---|
| 4.ගිණුම් කටයුතු භාවය හා යහපාලනය<br>**4.1.පාරිසරික ගැටලු** | සභාව සතු කසල මැෂිනරි ආයතනයට ලබා දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.7,842,000දරා තිබූ අතර කසළ අංගනයක් ප්‍රතිස්ථාපනය කොට කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමට හෝ එකතු වන දිරන කසළ ප්‍රමාණය අවම කරලිමට සභා බල ප්‍රදේශයට ගෘහස්ථ කොම්පෝස් බඳුන් ලබාදිම හෝ සිදු කරන දිරන කසළ බැහැර කිරිමට යන වියදම අඩු කර ගැනිම කෙරෙහි සභාව අවධානය යොමු කර නොතිබුණි. | | |